# නිස්සෝ ෆුකෝකා හිමි ප්‍රමුඛ දූත පිරිසක් 13 දා මෙරටට එති

අතිපූජ්‍ය නිස්සෝ ආර්. ෆුකෝකා හිමියන් ප්‍රමුඛ දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා ජූලි 13 දා දිවයිනට පැමිණෙන අතර, එදින කොළඹ 15, මෝදර



ශ්‍රී ලංකා එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානයේ ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේදී විශේෂ පිළිගැනීමේ උත්සවයක් පැවැත්වේ.

1945 ජූනි 17 දා ජපානයේ කෝබේ නගරයේ උපත ලද නිස්සෝ ආර්. ෆුකෝකා හිමියන් 1968 දී කන්සෙයි කුයින් විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත.

ෂොන්මොක්බුත්සු යිසු නිකායෙහි වයස 21 දී පැවිද්ද ලද එතුමා, වසර 25 ක් ඇමෙරිකාව, ඉතාලිය යන රටවල ධර්මදූත කටයුතුවල යෙදී ඇත.

එතුමා කෝබේ කොෆුජි විහාරස්ථානයේ නායක හිමියන් වන අතර, බුදුදහම පිළිබඳ ග්‍රන්ථ රාශියක කතුවරයෙකි. රිස්සෝ විශ්ව විද්‍යාලයේ ධර්මදූතවරයෙක් වන එතුමා ඇමෙරිකාවේ ෂොන්මොත්බුෂ්සු යිසු (H.B.S.) නිකායේ ප්‍රධාන සංඝනායක ද වේ.

ජාතීන් ආගම් සහ ජනතාව අතර සුහද මිත්‍රත්වය වර්ධනය උදෙසා ක්‍රියාකරන ශ්‍රී ලංකා එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානය එම හිමියන්ගේ දූත මෙහෙවර අගැයීම සහ උපහාර පිදුම මෙම උත්සවයේදී සිදුකරනු ඇත.